# ශ්‍රී ලංකාව කිරි නිෂ්පාදනයෙන් ස්වයං පෝෂිත වීමට නම්


එන්.පී.පී. සමන්ත
*පර්යේෂණ නිලධාරී*
කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.


**රටක ජනතාවගේ පෝෂණ මට්ටම නගා සිටුවීමේ දී, පශු සම්පත් ක්ෂේත්‍රයෙන් ඒ සඳහා ලැබෙන දායකත්වය ඉහළ මට්ටමක පවතී. ශ්‍රී ලාංකීය පශු සම්පත් කේෂ්ත්‍රය මූලික වශයෙන් කිරි පට්ටි පාලනයෙන් හා කුකුළු පාලනයෙන් සමන්විත වේ.** කිරි නිෂ්පාදනය පිළිබඳව සලකා බැලීමේ දී වර්තමානය වන විට, රටට අවශ්‍ය කිරි නිෂ්පාදනයත් ගෙන් දේශීය වශයෙන් දායක වන්නේ 15%ක පමණ ප්‍රමාණයක් පමණි. ඉතිරිය ආනයනය කෙරේ. මේ නිසා කිරි නිෂ්පාදනයෙන් රට ස්වයංපෝෂිත කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව අන් කවර දාකටත් වඩා වර්තමානයේ බුද්ධිමතුන්, සැලසුම්කරුවන් මෙන්ම ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ දැඩි අවධානයට යොමුව පවතී.

**ශ්‍රී ලංකාව,** දේශපාලන වශයෙන් නිදහස ලැබීමේ කාල වකවානුවේ සිටම කිරි නිෂ්පාදනයෙන් රට ස්වයංපෝෂිත කිරීමේ අරමුණ ඇතිව විවිධ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග, විවිධ රජයන් විසින් ගනු ලැබිණි. **නිදහසින් පසු බලයට පත් ප්‍රථම රජය විසින් කිරි නිෂ්පාදනය ආනයනය මත රඳා පැවතීම අවම කිරීමේ අරමුණ ඇතිව 1948-1968 විසි අවුරුදු සැලැස්ම ක්‍රියාත්මක කරන ලදී.** ඉන්පසු, 1958-1968 දස අවුරුදු සැලැස්මෙහි මූලික අරමුණ වූයේ ද, කිරි නිෂ්පාදනයෙන් රට ස්වයංපෝෂිත කිරීමයි. 1970 දී බලයට පත් වූ රජය විසින් දේශීය කිරි නිෂ්පාදනය නගා සිටුවමින් කිරි නිෂ්පාදනයෙන් රට ස්වයං පෝෂිත කිරීමේ අරමුණ ඇතිව දැඩි ආනයන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන ලදී. අනතුරුව, 1977 බලයට පත් රජය ආර්ථිකය ලිහිල් කිරීමේ ප්‍රතිපත්තිය යටතේ කිරි නිෂ්පාදනයේ ස්වයං පෝෂිත භාවය පිළිබඳ එතරම් අවධානයක් යොමු නොකළේය. 2001 වසරේ බලයට පත් රජය යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් වසර 2003-2010 සඳහා සකස්කර ඇති සත් අවුරුදු කෘෂිකාර්මික සැලැස්ම මඟින් වසර දහයක කාලයක් ඇතුළත රටට අවශ්‍ය කිරි හා කිරි නිෂ්පාදන රට තුළම නිපදවා ගැනීමේ අවශ්‍යතාව කෙරෙහි අවධානය යොමුකර තිබේ. ඒ යටතේ ස්වයංපෝෂිත ඉලක්ක වෙත ළඟාවීමේ අරමුණ ඇතිව උසස් ආරයේ සතුන් හඳුන්වාදීම, අභිජනන ක්‍රම ප්‍රචලිත කිරීම, කිරි නිෂ්පාදනය හා අලෙවිය විධිමත් කිරීම හා නැවුම් එළකිරි වෙත ජනතාව වැඩි වශයෙන් යොමු කිරීම වැනි උපාය මාර්ග පිළිබඳව අවධානය යොමු කර ඇත. නැවත මේ වසරේ දී බලයට පත් නව රජය මඟින් ද කිරි නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත වීමේ අවශ්‍යතාව මත පදනම්ව ඒ සඳහා වූ ක්‍රමෝපායයන් පිළිබඳව විමසිලිමත් වෙමින් සිටිනු දැකිය හැකිය.

ශ්‍රී ලාංකාවේ කිරි පට්ටි පාලනය පිළිබඳව අවධානය යොමු කරන විට, එය ප්‍රාදේශීය වෙනස්කම් අනුව ප්‍රධාන වශයෙන් කලාප හයකට බෙදා දැක්විය හැකිය. එනම් කඳුරට, මැදරට, වියළි කලාපය, පොල් ත්‍රිකෝණය, අන්තර් කලාපය හා යාපන අර්ධද්වීපය වශයෙනි. **කඳුරට හා මැදරට කලාපවල වතු වගාව ආශ්‍රිතව පාලිත තත්ත්වයන්ට වැඩි අවධානය යොමු කරමින් කිරි පට්ටි පාලනය සිදුවන අතර වියළි හා අන්තර් කලාපවල වැඩි වශයෙන් නිදැලි ක්‍රමය දක්නට ලැබේ.** පොල් ත්‍රිකෝණයේ පොල් වතු ආශ්‍රිතව ද යාපන අර්ධද්වීපයෙහි නාගරික කලාපයන් හි ද, කිරි පට්ටි පාලනය සිදු වේ. කිරි ගව ගහනයෙන් 70% පමණ වියළි හා අන්තර් කලාප වලට අයත්වන අතර ඉතිරිය සෙසු කලාප අතර බෙදී යයි. දිස්ත්‍රික්ක වශයෙන් සලකා බලනවිට **කුරුණෑගල දිස්ත්‍රික්කය තුළින් වැඩිම කිරි ගව ගහනයක් වාර්තා වන අතර වැඩිම කිරි නිෂ්පාදනයක් වාර්තා වන්නේ නුවරඑළිය දිස්ත්‍රික්කයෙනි.**

අනෙක් පිටුවෙහි සංඛ්‍යා සටහනට අනුව, වර්ෂ 1993 සිට 2002 දක්වා වසර දහයක කිරි ගවයින් ගහනය පිළිබඳව සලකා බැලීමේ දී, එහි සැම අංශයකම පැහැදිලි අඩුවීමක් දක්නට ලැබේ. 1993 දී මිලියන 1.7 ක්ව පැවති සමස්ත කිරිගව ගහනය 2002 වසර වනවිට මිලියන 1.5 දක්වා පැහැදිලි අඩුවීමක් පෙන්නුම් කරයි. මෙම තත්ත්වය සඳහා කිරි පට්ටි පාලනයට අලුතෙන් එකතුවන කිරි ගොවීන්ගේ සංඛ්‍යාත්මක අඩුවීමක් හෝ කිරිගව පාලනයෙහි යෙදී සිටි පිරිස ඉවත්වීමක් හේතුවිය හැකිය. මෙවැනි තත්ත්වයකට හේතුව වන්මන් කිරි ගොවියා යම් කිසි ගැටළුකාරී තත්වයකට මුහුණ දී තිබීම යැයි උපකල්පනය කළ හැකිය. කිරි නිෂ්පාදනයෙන් රට ස්වයංපෝෂිත කිරීමේ අරමුණ කරා ගමන් කිරීමේ දී මෙම ගැටළුකාරී තත්ත්වයන් අවම කිරීම සඳහා අදාළ වන විසඳුම් ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් ය.

කිරි පට්ටි පාලනය සම්බන්ධයෙන් වගකීම දරන හා සේවා සපයන රාජ්‍ය හා පෞද්ගලික ආයතන කිහිපයක් හඳුනා ගත හැකිය. **කෘෂිකර්ම අමාත්‍යාංශය, පළාත් සත්ත්ව සංවර්ධන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය,** රාජ්‍ය අංශයෙන් කැපී පෙනෙයි. ඒට

## ශ්‍රී ලංකාවේ ගව ගහනය - 1993/2002

*ඒකක දහස් ගණන් වලින්*

| වර්ෂය | කිරි ලබාදෙන දෙනුන් සංඛ්‍යාව | කිරි ලබා නොදෙන දෙනුන් | අනෙකුත් දෙනුන් සංඛ්‍යාව සංඛ්‍යාව | ගොනුන් සංඛ්‍යාව | වසු පැටවුන් පැටවුන් සංඛ්‍යාව | එකතුව | කිරි නිෂ්පාදන ලීටර්/ මිලියන |
|---|---|---|---|---|---|---|---|
| 1993 | 344 | 343 | 340 | 281 | 396 | 1704 | 245 |
| 1994 | 353 | 333 | 341 | 285 | 391 | 1703 | 250 |
| 1995 | 354 | 342 | 333 | 282 | 394 | 1705 | 253 |
| 1996 | 342 | 355 | 315 | 267 | 364 | 1643 | 249 |
| 1997 | 332 | 342 | 295 | 259 | 351 | 1579 | 252 |
| 1998 | 331 | 352 | 306 | 254 | 356 | 1599 | 256 |
| 1999 | 339 | 351 | 304 | 258 | 365 | 1617 | 260 |
| 2000 | 334 | 337 | 285 | 244 | 357 | 1557 | 263 |
| 2001 | 335 | 338 | 285 | 246 | 361 | 1565 | 265 |
| 2002 | 321 | 328 | 272 | 239 | 351 | 1511 | 266 |

*මූලය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

අමතරව, අර්ධ රාජ්‍ය ආයතන වශයෙන් විවිධ සමුපකාර සමිති හා පෞද්ගලික අංශයෙන් **සීමාසහිත මිල්කෝ සමාගම, නෙස්ලේ ලංකා සමාගම, ජාත්‍යන්තර කිරි නිෂ්පාදන සමාගම** හා වෙනත් කුඩා පරිමාණ ආයතන කිරි එකතු කිරීම හා සේවා සැපයීම මගින් මෙකී අංශයට දායකත්වය සපයයි.

**කුරුණෑගල, අනුරාධපුර** හා **නුවරඑළිය** යන දිස්ත්‍රික්කවල කිරි ගොවීන් සමඟ මෙන්ම සේවා සපයන., රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීමේ දී, වර්තමානයේ කිරි පට්ටි පාලනය හා සම්බන්ධව මතු වී ඇති ගැටළුකාරී තත්ත්වයන් කිහිපයක් හඳුනාගත හැකි විය. කිරි, නිෂ්පාදනයෙන් රට ස්වයංපෝෂිත කිරීමේ අරමුණ ඇතිව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී , එසේ හඳුනා ගන්නා ලද ගැටළු හා බාධක වලට නිසි විසඳුම් සෙවීම ඉතා වැදගත් වේ.

කිරි පට්ටි පාලනයෙ හි නිරතවන ගොවීන් වර්තමානයේ මුහුණදෙන මූලික ගැටළුවක් වන්නේ වැඩි කිරි ප්‍රමාණයක් ලබාගත හැකි උසස් ආරයේ කිරි ගවයින් ලබා ගැනීමේ අපහසුතාවය යි. මෑතක් වන තෙක්ම රජයේ ගොවිපළ වෙතින් උසස් ආරයේ සතුන් ලබා ගත හැකි වුවත්, වර්තමානයේ ඒ අවස්ථාව ගොවීන්ට ඇහිරී ගොසිනි. **වර්ෂ 1972 අංක 11 දරන කෘෂිකර්ම පනතට අනුව, වර්ෂ 1973 දී, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය පිහිටුවීමේ දී එහි මූලික අරමුණු අතර පශු සම්පත් බෝ කිරීම හා බෙදා හැරීම ද ඇතුළත් විය.** කෙසේ වුවද, සාකච්ඡාවට ලක් කළ ගොවීන්ගේ දැවෙන ගැටළුවක් වී ඇත්තේ, ඔවුන්ට මුදල් ගෙවා හෝ උසස් ආරයේ කිරි ගවයින් ලබා ගැනීමේ හැකියාවක් නොමැති වීමයි.

එමෙන්ම, මෑත කාලීනව කිරි නිෂ්පාදන පිරිවැය ඉහළයාම ද, ක්ෂේත්‍රය තුළ නිරත ගොවීන්ට මුහුණ දීමට සිදු වී ඇති ප්‍රබල ගැටළුවකි. **මහ බැංකු වාර්තාව-2003** පෙන්වා දෙන පරිදි පුන්නක්කු හා අනෙකුත් සත්ත්ව ආහාර මිල ගණන් ඉහළ යාම ද, කිරි නිෂ්පාදනයේ ලාභ ආන්තිකය අඩුවීමට බලපා තිබේ. මෙය එක් අතකින් කිරි පට්ටි පාලනයෙහි නිරතවන ගොවීන් අධෛර්යමත් කිරීමට බලපාන කාරණයකි. දැනට කිරි ලීටරයක් වෙනුවෙන් රු. 15/- පමණ මුදලක් ලැබුන ද, පිරිවැය තත්ත්වය සමඟ සසඳා බැලීමේ දී, එය කිසිසේත් ප්‍රමාණවත් නොවන බව ගොවීන්ගේ මතයයි. මෙය ගොවීන්ගේ ලාභ ආන්තිකය අඩු වීමට ප්‍රබල ලෙස බලපා තිබේ. විශේෂයෙන්ම, ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනයට ඉහළම දායකත්වය සපයන **නුවරඑළිය** දිස්ත්‍රික්කයෙහි ගොවීන්, පාලිත තත්ත්වයන් යටතේ කිරි ගවයින් ඇති කරන අතර එහිදී සාන්ද්‍ර ආහාර භාවිතය ඉහළ මට්ටමක පවතී. **සත්ත්ව ආහාර මිල ගණන් ඉහළ යාම එකී ගොවීන්ට විශාල තර්ජනයකි.** කිරි නිෂ්පාදන පිරිවැය කෙරෙහි සත්ත්ව ඖෂධ මිල ගණන් ඉහළ මට්ටමක පැවතීම, තවත් සෘජුව බලපාන සාධකයකි. මෙකී සියළු සාධකවල අවසන් ප්‍රතිඵලය ගොවියාගේ ලාභ ආන්තිකය අඩු වී යාමයි. රජය මේ දිනවල කෘෂි ක්ෂේත්‍රයේ පොහොර මිල අඩු කිරීම සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු කරන ආකාරයටම සත්ත්ව ආහාර සම්බන්ධයෙන් පවතින තත්ත්වයන් කෙරෙහි ද විශේෂ සැලකිල්ලක් යොමු කිරීම කාලෝචිත ය.

ශ්‍රී ලංකාවේ වියළි හා අන්තර් කලාප සම්බන්ධයෙන් සලකා බැලීමේ දී ගව පාලනයෙහි ප්‍රචලිත ක්‍රමය බවට පත්ව ඇත්තේ ගවයින් පට්ටි වශයෙන් නිදැල්ලේ උලා කෑම සඳහා යොමු කිරීමයි. මෙහි දී, වර්තමානය වන විට, සතුන්ට අවශ්‍ය තෘණ භූමි ජනගහනය ප්‍රසාරණය වීම හා විවිධ සංවර්ධන වැඩසටහන්වල ව්‍යාප්තිය හේතුවෙන් ක්‍රමයෙන් හීන වීමක් දැකිය හැකිය. මෙහි අවසන් ප්‍රතිඵලය වී ඇත්තේ ගවයින්ගෙන් වගා භූමි පාළු වීමයි. මේ හේතුවෙන් ගොවීන් හා ගව

**හිමියන් අතර නිරන්තර ආරවුල් ඇති වේ. මෙය වියළි හා අන්තර් කලාප තුළ සුලබ සිදුවීමකි.** මේ සියල්ලෙහි අවසාන ප්‍රතිඵලය වන්නේ කිරි පට්ටි පාලනයෙන් ගොවීන් තව තවත් ඈත් වීමකි.

**කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් කිරි පට්ටි පාලනයෙ හි වර්ධනය සඳහා විවිධ පියවර ගෙන තිබීම, පැසසුමට ලක් විය යුතු කරුණකි.**

එමෙන්ම, සාම්ප්‍රදායිකව ගවයින්ගේ තෘණ භූමියක් වූ වැව් තාවුල්ලේ අනවසර ඉදි කිරීම් හා වගා කටයුතු බහුලව සිදුවීම, අර්බුදය තවත් තීව්‍ර කර තිබේ. මෙවැනි ගැටළුවක් ප්‍රායෝගිකව මතු වූ අවස්ථාවක් මෑතක දී දැකිය හැකි විය. ඒ **නිදැල්ලේ යන ගවයින් උඩවලව ජාතික වනෝද්‍යානයට ඇතුළුවීම මගින් විවිධ ගැටළු මතුවීම යි.** මෙම සියළුම කරුණු වලින් පෙනී යන්නේ ගව පාලනයට ජනතාව යොමුකරන්නේ නම් ගව ආහාර පහසුවෙන් සපයාගත හැකි ආකාරයේ ක්‍රමවේදයක් සැකසීම අත්‍යාවශ්‍ය බවයි.

කිරි පට්ටි පාලනයෙහි වර්ධනය සම්බන්ධයෙන් සලකා බැලීමේ දී, එම අංශයට ලැබෙන ව්‍යාප්ති සේවාවන් ඉහළ වැදගත්කමක් ගනී. ඒ තුළින් ගොවීන්ට නව දැනුම, නව තාක්ෂණය හා නිවැරදි ක්‍රමෝපායයන් ගලායාමක් සිදු වේ. පිරිවැය තත්ත්වයන් අවම කර ගනිමින් ලාභ ආන්තිකය ඉහළ නංවා ගැනීමේ ක්‍රමෝපායයන් නිරන්තරයෙන් ගොවීන් වෙත ගලා යා යුතුය. මෙම අංශයට සේවා සපයන ආයතන කිහිපයක් හඳුනා ගතහැකි අතර ඒ අතරින් **සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව** ඉහළ වැදගත්කමක් දරයි. කෙසේ වුව ද, පූර්ව සමීක්ෂණ මඟින් හෙළි වී ඇත්තේ කිරි ගොවීන් වෙත සේවා සැපයීම දුර්වල මට්ටමක පවතින බවයි. මේ තත්ත්වය කිරිපට්ටි පාලනය සංවර්ධනය කිරීමේ දී ප්‍රබල බාධාවකි. විශේෂයෙන්ම, රාජ්‍ය අංශයේ කිරි ගොවීන්ට සේවා සැපයීම සම්බන්ධයෙන් පහළම ඒකකය වන **සත්ත්ව සංවර්ධන උපදේශක (LDI)** වරයෙකුට ආවරණය කිරීමට ඇති ගොවීන් සංඛ්‍යාව ඉහළ මට්ටමක පැවතීම, ප්‍රවාහන දුෂ්කරතා හා විවිධ ආයතනික පරිපාලනමය හේතු , නිසි පරිදි කිරි ගොවීන්ට සේවා සැපයීමේ දී බාධක බවට පත්ව තිබේ. මෙකී තත්ත්වයන් මඟ හරවා ගැනීම මෙම ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේ දී ප්‍රබල අවශ්‍යතාවයක්ව පවතී.

ශ්‍රී ලංකා **මහ බැංකු වාර්තාව 2002** පෙන්වා දෙන ආකාරයට කිරි නිෂ්පාදනය පසුගිය වසරට සාපේක්ෂව ඉහළ ගිය ද, කිරි එකතු කිරීම් පහළ මට්ටමක පැවතී ඇත. මේ සඳහා ගොවිපළ මිල අඩු වීම හා දුර්වල අලෙවි ක්‍රමයන් බලපා තිබේ. මෙහි දී, ශ්‍රී ලංකාවේ කිරිපට්ටි පාලනයෙහි නිරතවන ගොවීන් ගෙන් සියයට 95 පමණ සුළු පරිමාණ කිරි ගොවීහු වෙති. ඔවුන්ගේ බහුතරය ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන්නන් වන අතර ඔවුන් වෙත පහසුවෙන් ළඟා විය හැකි ආකාරයේ අලෙවි ජාලයක් පැවතීම ඉතාමත්ම අත්‍යාවශ්‍යය. වර්තමානය වනවිට, බොහෝ ගොවීන් අතරමැදි ග්‍රහනයට හසුවීම හා පහළ මිලක් ලැබීම හේතුවෙන් කලකිරීමට පත්ව සිටි. එය කර්මාන්තයේ සංවර්ධනයට බාධාවකි. මෙම තත්ත්වයන් මඟ හරවා ගනිමින් මනා අලෙවිකරණ ජාලයක් හරහා ගොවීන්ට ද වාසි සහගත වන පරිදි කිරි එකතු කිරීම් ශක්තිමත් කරන්නේ නම්, එය මෙම ක්ෂේත්‍රයේ යෙදී සිටින ගොවීන්ව තවදුරටත් ඒ තුළ රඳවා ගැනීමට හේතුවක් වනු නොඅනුමානය.

කෙසේ වුව ද, වර්තමානය වන විට, **කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් කිරි පට්ටි පාලනයෙ හි වර්ධනය සඳහා විවිධ පියවර රැසක් ගෙන තිබීම, පැසසුමට ලක් විය යුතු කරුණකි.** නැවුම් එළකිරි සඳහා ජනතාව නැඹුරු කිරීම හා **ගෝකුල ගම්මාන වැඩ සටහන** යටතේ ගව පාලනයට ගොවීන් යොමු කිරීම ඒ අතරින් කැපී පෙනෙයි.

ලෝක පශු සම්පත් විශේෂඥයින්ගේ පෙන්වා දීමට අනුව, **ලෝකයේ පශු සම්පත් අතින් දියුණු තත්ත්වයකට පත් රටවල පවතින ආකාරයේ ශක්‍යතාවයක් ශ්‍රී ලංකාවේ ද පවතී.** ගැටළුව වී ඇත්තේ දේශීය වශයෙන් එකී සම්පත් නිසි පරිදි උපයෝජනය නොකිරීම යි.

කිරි පට්ටි පාලනය නගා සිටුවීම ග්‍රාමීය ආර්ථික වර්ධනය ඉහළ නැංවීමට ප්‍රබල හේතුවක් වේ. විශේෂයෙන්ම, ශ්‍රී ලංකාවෙහි දිළිඳු ජන කොටසෙන් අති බහුතරයක් වෙසෙන ග්‍රාමීය අංශයෙහි ජනතාවගේ ආදායම් මට්ටම ඉහළ නංවාලීමට හා මන්දපෝෂණය අවම කිරීමට කිරි පට්ටි පාලනය ප්‍රචලිත කිරීමෙන් ඉහළ දායකත්වයක් ලැබෙනු නියතය. එමෙන්ම, වාර්ෂිකව විදේශයන්ට ඇදී යන රුපියල් බිලියන එකොළහක් පමණ වන විදේශ විනිමය අවම කර ගනිමින් ජාතික ආර්ථික වර්ධනය ඉහළ නැංවීමට ද, ඒ තුළින් විශාල දායකත්වයක් ලැබෙනු ඒකාන්තය.

**ලෝකයේ පශු සම්පත් අතින් දියුණු තත්ත්වයකට පත් රටවල පවතින ආකාරයේ ශක්‍යතාවයක් ශ්‍රී ලංකාවේ ද පවතී.**

*ස්තුතිය .........!*
*මෙම ගොවි ජනතා කලාපය සඳහා ප්‍රවෘත්ති හා ප්‍රකාශන ඒකකයේ එස්. රාමේස්වරන් මහතාගෙන් ලැබුණ සහයෝගයට ස්තුතිය හිමි වේ.*
*- සංස්කාරක -*